# 9. ජේසුතුමාගේ ජයමහ (1)

ජේසුතුමා නිතර ම
දෙවි පියාට කතා කළා.
කුරුසියේ ගමන යන්නට
පෙරත් දෙවි පියාට කතා
කළා.





ජේසුතුමා බර කුරුසයක්
කර තබා ගෙන කල්වාරි
කන්ද නැංගා.



ජේසුතුමා කුරුසය
කර තබා ගෙන යද්දී
දෙව්මවු මුණ ගැසුණා.



ජේසුතුමා කුරුසයේ දුක් වින්දා
අප වෙනුවෙන් දිවි පිදුවා.
මෙය සිදු වූයේ
උතුම් සිකුරාදා දවසකයි.

## පැවරුම්

පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. ජේසුතුමා කුරුසයේ ගමන යාමට පෙර කළ දේ කුමක්ද?
2. කුරුසය ගෙන යන විට දී ජේසුතුමාට මඟ දී හමු වූයේ කවුද?
3. ජේසුතුමා දිවි පිදුවේ කවුරුන් වෙනුවෙන් ද?